ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.

D.S. Senanayake College, Colombo 07.

තුන්වන වාර ඇගයීම -2016

Third Term Test - 2016

12 ශ්‍රේණිය -

Grade 12

# දේශපාලන විද්‍යාව - I

# Political Science - I

පැය තුනයි.

Three hours

- ප්‍රශ්න සියල්ලටම දී ඇති පිළිතුරු පත්‍රයේම නිවැරදි පිළිතුර ලකුණු කරන්න.
- ප්‍රශ්න අංක. 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් එකක් නොගැළපේ. වැරදි ප්‍රකාශය තෝරන්න.

(01) ග්‍රීක යුගයෙන් අධ්‍යයනය ඇරඹූ දේශපාලන විද්‍යාව,

(1) රාජ්‍ය කේන්ද්‍ර කොටගත් අධ්‍යාපනයකට යොමුවිය.

(2) නූතන යුගයේ දී බලය පිළිබඳ කෙරෙන අධ්‍යයනයකට යොමුවිය.

(3) 19 වන සියවස වනවිට රාජ්‍ය පරිපාලනය හා කළමනාකරණයට යොමු විය.

(4) 21 සියවසේ රාජ්‍ය තේමාව ඉවත් විය.

(5) සමාජ විද්‍යා විෂයයන් රැසක් එක්කොට ගත් විෂය මාලාවක් විය.

(02) චර්යාවාදී අධ්‍යයන ක්‍රම නිසා දේශපාලන විද්‍යාවේ එක්වූ නව අංගෝපාංග වූයේ,

(1) දේශපාලන විචාරය

(2) දේශපාලන චර්යාව

(3) දේශපාලන සමාජනුයෝජනය

(4) දේශපාලන ප්‍රභූන්

(5) දේශපාලන සංස්කෘතීන්

(03) දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ ඇති වැදගත්කම වනුයේ,

(1) තමා ජිවත්වන දේශපාලන පරිසරය පිළිබඳ අවබෝධයක් ලද හැකි වීම යි.

(2) විචාරශීලීත්වය ඉහළ යාම යි.

(3) අන්තර් ජාතික සමාජය පිළිබඳ අවබෝධය ලබාගත හැකි වීම යි.

(4) පුරවැසියෙකු ලෙස වගකීම් හා යුතුකම් පිළිබඳ අවබෝධයක් ලැබීම යි.

(5) සියළු විෂයයන් සම්බන්ධ දැනුවත් පුද්ගලයෙකු වීම යි.

(04) ලිබරල්වාදීන්ට අනුව රාජ්‍යය,

(1) ධනපති පන්තියේ ආශාවන් හා අවශ්‍යතාවයන් පෙරටු කොට ගත්ත කි.

(2) දීර්ඝ සමාජ විකාශනයක ප්‍රතිඵලය කි.

(3) සංවිධිත සමාජයක් වෙත මිනිසුන් ඒකරාශි වීමත් සමග රාජ්‍ය ගොඩ නැඟුනි.

(4) මිනිසාගේ සමාජ ප්‍රගමනය සඳහා රාජ්‍ය අත්‍යවශ්‍ය මැදිහත් කරුවෙකි.

(5) සූරාකෑම හා මර්ධනය පදනම් කොට රාජ්‍ය බිහිවී ඇත.

(05) ජනවාර්ගිකත්වය හා සැසඳෙන ප්‍රකාශයන් ය.

(1) සුවිශේෂි වූ භාෂාවක් භාවිත කරයි.

(2) අනන්‍ය ආගමක් අදහයි.

(3) සුවිශේෂි සංස්කෘතියකට හිමිකම් කියයි.

(4) රාජ්‍යයට නිල නාමය මෙමගින් හිමි වේ.

(5) ඓතිහාසික උරුමයන් සමූහයක් ඇත.

(06) බලය බෙදා දැක්වීමෙන් ලද හැකි වාසි වන්නේ,

(1) ඒකාධිපතියෙකු නිර්මාණය වීම වැළැක්වේ.
(2) ආයතන අතර බලය සංවරණය වේ.
(3) විධායකය ශක්තිමත් වේ.
(4) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්‍ෂා වේ.
(5) ආණ්ඩුවේ බලය සංවරණය වේ.

(07) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පුරවැසියන්ගේ යුතුකම වන්නේ,

(1) රජයේ නිතිවයට අවනත වීම.
(2) නිසියාකාරව බදු ගෙවීම.
(3) රාජ්‍ය දේපල අයථා පරිහරණයෙන් වැලකීම.
(4) නිතිය හා සාමය පවත්වාගෙන යාමට උපකාරී වීම.
(5) රාජ්‍ය සේවා ආයතනවලින් පමණක් ම සේවා ලබා ගැනීම.

(08) පැසිස්ට් රාජ්‍යයක ලක්‍ෂණයක් ය,

(1) යුද්ධකාමීන් වීම.
(2) ජාත්‍යන්තර නිතියට සහය දීම.
(3) නායකයාට හා පක්‍ෂයේ ප්‍රභූන්ට අවනත වීම.
(4) රාජ්‍ය අසාහයත්වය
(5) රාජ්‍යය මගින් ආර්ථිකය පාලනය කිරීම.

(09) සමාජවාදී රාජ්‍යයක ලක්‍ෂණයකි,

(1) ඒකපක්‍ෂ නායකත්වයක් පැවතිම.
(2) කොමියුනිස්ට් පක්‍ෂයේ නියම කිරීමට අනුව දේශපාලන ආයතන පද්ධතිය ක්‍රියාත්මක කිරීම.
(3) සාමූහිකත්වය පදනම් කරගෙන සමාජ ක්‍රමය ගොඩ නැගීම.
(4) පෞද්ගලික දේපල ක්‍රමය පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.
(5) කොමියුනිස්ට් මූලධර්ම වලට අනුව සමාජ සාරධර්ම සකස් කිරීම.

(10) දේශපාලන සමාජානුයෝජනයේ ප්‍රතිඵලය කි.

(1) දේශපාලන ක්‍රමයක යෙදවුම් නිමවුම් කෙරෙහි ප්‍රතිචාර නොදැක්වීම.
(2) දේශපාලන ක්‍රමයේ පැවැත්මට අවශ්‍ය තනතුරු සඳහා පුද්ගලයින් පුහුණුව සිටීම.
(3) ඒකීය දේශපාලන සංස්කෘතියක් පවත්වාගෙන යාමට හුරුවීම.
(4) ජාතික දේශපාලන ක්‍රමයකට ජනතාවට හුරුපුරුදු කිරීම.
(5) දේශපාලනඥයින් හා දේශපාලන ක්‍රියාකාරිකයින් පුහුණු වී සිටීම.

(11) වැඩවසම් රාජ්‍ය ක්‍රමය,

(1) රෝම අධිරාජ්‍ය බිඳ වැටීමෙන් පසුව ආරම්භ විය.
(2) පාප් අධිරාජ්‍යය තුළ ක්‍රියාත්මක වේ.
(3) රාජාණ්ඩු පාලන ක්‍රමයක් පවතී.
(4) ආර්ථික ක්‍රමය කෘෂිකර්මාන්තය මත පදනම් වේ.
(5) ශක්තිමත් මධ්‍යම අධිකාරියක් මත ගොඩ නැගී තිබුණි.

(12) ජාතික රාජ්‍ය බිහිවීම කෙරෙහි බලපෑ සාධකයන්ය,

(1) පාප් අධිරාජ්‍යයේ බිඳ වැටීම.
(2) ධනවාදයේ ආරම්භය
(3) වැඩවසම් ක්‍රමය ස්ථාවරව පැවතිම.
(4) ක්‍රිස්තියානි ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාර
(5) කාර්මික විප්ලවය

(13) නිර්බාධවාදී රාජ්‍ය ක්‍රමයේ ලක්‍ෂණයන් ය.

(1) වෙළඳපොළ බලවේගය විසින් ආර්ථිකය හැසිරවීම.
(2) රාජ්‍ය ආර්ථික කටයුතු වලින් සම්පූර්ණයෙන් ඈත්වීම.
(3) පෞද්ගලික අංශය විසින් ආර්ථික කටයුතු මෙහෙය වීම.
(4) රාජ්‍යය නිතිය හා සාමය ආරක්‍ෂා කිරීම.
(5) ආර්ථික කටයුතුවලදී පෞද්ගලික අංශයට අසීමිත නිදහසක් හිමිවීම.

(14) සමාජ විකාශනාත්මක වාදීන්ට අනුව මිනිසුන් එකට එක්තැන් කරන සමාජ බන්ධනයක් වන්නේ,

(1) ඥාති සබඳතා (2) ආගමික බැඳීම් (3) වෘත්තිය සබඳතා
(4) ආර්ථික අවශ්‍යතා (5) දේශපාලන හැඟීම්

(15) ආණ්ඩුව යනු,

(1) ජනතා අපේක්ෂාවල ප්‍රතිමූර්තය යි.
(2) මිනිස් සමාජය පාලනය කරන ආයතනය යි.
(3) රාජ්‍ය පාලනය කරන්නා වූ පුද්ගල කණ්ඩායම යි.
(4) සමාජයීය කටයුතු මෙහෙයවන බල අධිකාරිය යි.
(5) රාජ්‍ය පාලනය කරන ක්‍රමවේදයේ හිමිකරුවා ය.

**• ප්‍රශ්න අංක. 16 සිට 25 දක්වා වූ ප්‍රශ්නවලදී නිවැරදි ප්‍රකාශන ඇතුළත් කාණ්ඩය තෝරන්න.**

(16) ඒකීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණයකි.

A- බලය බෙදා හැරීම. B- ඒකීය පුරවැසි භාවය
C- බලය අවධාරිත කිරීම. D- එකම පරිපාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
E- ස්වාධිපත්‍ය බලය තනි මධ්‍යම ආණ්ඩුවකට හිමිවීම.

(1) ABCD (2) ACDE (3) ABDE (4) ABCE (5) BCDE

(17) සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක දැකිය හැකි ලක්ෂණයකි.

A- බලය බෙදා හැරීම.
B- ඒකීය පුරවැසි භාවය
C- බලය අවධාරික කිරීම.
D- එකම පරිපාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
E- ස්වාධිපත්‍ය බලය තනි මධ්‍යම ආණ්ඩුවකට හිමිවීම.

(1) ABCD (2) ACDE (3) ABDE (4) ABCE (5) BCDE

(18) නූතන රාජ්‍යයන් සන්ධීය ආණ්ඩුක්‍රමයකට යොමුවීමට බලපෑ සාධකයන් ය.

A- අසල්වැසි රාජ්‍යයන්ගේ බලපෑම.
B- ජනවාර්ගික අර්බුද පැවතිම.
C- ඒකීය රාජ්‍යය ක ජනවර්ග වෙන්වීම ට උත්සාහ කිරීම.
D- විශාලත්වයෙන් වැඩි රාජ්‍යයන් පාලන කටයුතු විධිමත් කර ගැනීම ට කටයුතු කිරීම.
E- භූගෝලීය විෂමතාවයන් විසින් භූමිය වෙන්කර තිබීම.

(1) ABCD (2) ACDE (3) ABDE (4) ABCE (5) BCDE

(19) විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව බෙදිය හැකි ආණ්ඩුක්‍රම ආකෘතින්,

A- කැබිනට් ආණ්ඩු B- ජනාධිපති ආණ්ඩු
C- ඒක පුද්ගල තන්ත්‍ර D- මිශ්‍ර විධායක
E- සන්ධීය ආණ්ඩු

(1) ABCD (2) ACDE (3) ABDE (4) ABCE (5) BCDE

(20) ව්‍යවස්ථාදායකය,

A- ජාතික මුදල් පාලනය කරයි.

B- නීති පනවයි.

C- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරයි.

D- ජාතික ප්‍රශ්න සාකච්ඡා කරයි.

E- අධිකරණ තීන්දු විමර්ශනය කරයි.

(1) ABCD (2) ACDE (3) ABDE (4) ABCE (5) BCDE

(21) කැබිනට් ආණ්ඩුක්‍රමයක,

A- විධායක බලය ක්‍රියාත්මක කිරීමේ දී ජනතා පරමාධිපත්‍යයට එකඟ වෙයි.

B- විධායකය පාලනය කිරීමට ව්‍යවස්ථාදායකට හැකියි.

C- ව්‍යවස්ථාදායක ප්‍රබල ආයතනයකි.

D- අධිකරණයට බලපෑම් නොකරයි.

E- ව්‍යවස්ථාදායක අභිබවා මහජන බලවේග ක්‍රියාත්මක වෙයි.

(1) ABCD (2) ACDE (3) ABDE (4) ABCE (5) BCDE

(22) ජනාධිපති ආණ්ඩුක්‍රමයක,

A- ද්විත්ව විධායයක් පවති.

B- ජනාධිපතිවරයා සෘජු මහජන ඡන්දයෙන් තෝරා ගනියි.

C- අගමැති හා කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට වග කියයි.

D- ජනාධිති හා ව්‍යවස්ථාදායක එකම කණ්ඩායමක කොටස්කරුවන් ය.

E- ජනාධිපති විසින් අගමැති හා අමාත්‍ය මණ්ඩලය පත් කරයි.

(1) ABCD (2) ACDE (3) ABDE (4) ABCE (5) BCDE

(23) සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයන් ය,

A- ලැයිස්තු ක්‍රමය

B- ප්‍රාථමික ජනතා මණ්ඩල ක්‍රමය

C- ජනමතවිචාරණ ක්‍රමය

D- ප්‍රාරම්භනය

E- පුනරාවර්තනය

(1) ABCD (2) ACDE (3) ABDE (4) ABCE (5) BCDE

(24) දේශපාලන ප්‍රචණ්ඩත්වය දැකිය හැකි අවස්ථාවන්,

A- ආගමික උත්සව

B- සම්ප්‍රදායික යුද්ධ

C- ත්‍රස්තවාදය

D- හමුදා බලය පැහැර ගැනීම.

E- විප්ලවකාරී අවස්ථා

(1) ABCD (2) ACDE (3) ABDE (4) ABCE (5) BCDE

(25) පුද්ගල දේශපාලන චර්යා අවබෝධ කරගත හැකි අවස්ථා වන්නේ,

A- මහජනයා දේශපාලනයට සහභාගි වන ආකාරයන්

B- වැඩ වර්ජන වැනි ප්‍රදර්ශනාත්මක දේශපාලන ක්‍රියාවලදී

C- ආශාවන් හා බලපෑම් කණ්ඩායම් ක්‍රියාකාරීත්වයන් හිදී

D- ආණ්ඩුවේ ක්‍රියාකාරකම්වල දී

E- දේශපාලන සන්නිවේදනයේ දී

(1) ABCD (2) ACDE (3) ABDE (4) ABCE (5) BCDE

- **ප්‍රශ්න අංක. 26 සිට 35 දක්වා නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

(26) සරල බහුතර නියෝජන ක්‍රමය නිසා,

(1) සුළු පක්ෂ ශක්තිමත් වේ.

(2) ශක්තිමත් ආණ්ඩු බිහිවේ.

(3) සභාග ආණ්ඩු වැඩි වශයෙන් බිහි වේ.

(4) මන්ත්‍රීවරයා නායකයාගේ වන්දි බට්ටයෙක් වේ.

(5) මැතිවරණ දෙකක් අතරතුර ජනමත විමසීමේ අවස්ථා ගිලිහේ.

(27) සමානුපාතික නියෝජන ක්‍රමයේ දුර්වලතාවයකි.

(1) ඡන්දදායකයා හා මන්ත්‍රීවරයා අතර සබඳතාවය බිඳවැටීම.

(2) දක්ෂ සැබෑ නියෝජනයන් සිදු නොවීම.

(3) ලැබූ ඡන්ද වලට සාමනුපාතිකව මන්ත්‍රී ධුර නොලැබීම.

(4) විශාල ඡන්ද ප්‍රමාණයකට වටිනාකමක් නොලැබීම.

(5) මැතිවරණ කොට්ඨාශය කුඩා වීම.

(28) දේශීපාලන සාමානුයෝජනය කාරකයක් වේ.

(1) පවුල (2) මිත්‍ර සමාගම් (3) ජනමාධ්‍යය

(4) ආගමික සංවිධාන (5) පුද්ගල ලැදියාවන්

(29) දේශපාල ප්‍රභූන් බිහිවීමට බලපෑ හැකි සාධකය නොවන්නේ,

(1) පරම්පරාව (2) අවාහ විවාහ සම්බන්ධතා (3) කුලය

(4) බලය (5) දේශපාලන හැකියාවන්

(30) අයිතිවාසිකම් වල ඇති ප්‍රායෝගික වැදගත්කමකි.

(1) නිදහස පුළුල් වීම.

(2) සංවර්ධන මැනීමේ නිර්ණායකයක් වීම.

(3) නීතිය නොතකා කටයුතු කළ හැකි වීම.

(4) ඕනෑම වෘත්තියක යෙදීමට හැකි වීම.

(5) වැරදිකරුවන් නොවූ මිනිසුන්ට පමණක් හිමිවීම.

(31) නීතිය,

(1) සිවිල් සමාජයේ ප්‍රබල අධිකාරියක් නොවේ.

(2) මිනිසාගේ සමාජ පැවැත්ම පාලනය කරයි.

(3) සමාජ වෙනස්වීම් සමග වෙනස් වේ.

(4) සිවිල් සමාජයේ සදාචාරය පිළිබඳ නොසැලකිලිමත් ය.

(5) සමාජයෙන් සමාජයට වෙනස් නොවේ.

(32) අයිතිවාසිකම් හා නොසැසැදෙන ප්‍රකාශය වන්නේ,

(1) පෞරුෂත්වය වර්ධනය කර ගැනීමට උපකාරී වේ.
(2) සිවිල් හා දේශපාලන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.
(3) සංවිධිත සමාජය තුළ පමණක් භුක්ති විඳිය හැකිය.
(4) යුතුකම්වලින් බැහැරව පවතී.
(5) සමාජ අයිතිවාසිකම් රාජ්‍ය නීතිය මගින් සුරක්ෂිත කෙරේ.

(33) නීතිමය යුතුකමක් වන්නේ,

(1) සියලුම සිසුන්ට අධ්‍යාපනය ලබාදීම.
(2) රාජ්‍යය ට අවනත බව දැක්වීම.
(3) දෙමාපියන් රැක බලා ගැනීම.
(4) දූ දරුවන් පෝෂණය කිරීම.
(5) අසාධාරණ වුවත් ආණ්ඩුවේ යෝජනාවලට විරෝධය පළ නොකිරීම.

(34) නිදහස සුරක්ෂිත කිරීමට නූතන රාජ්‍ය යොදා ඇති විධි විධානයකි.

(1) නීතියේ ආධිපත්‍ය පවත්වා ගෙන යෑම.
(2) අධිකරණ සේවයේ පත් කිරීම් විධායකයට අභිමත පිරිදී කිරීම.
(3) ඕනෑම ආයෝජනයක ට ඉඩ සැලසීම.
(4) මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමෙන් වැළකීම.
(5) ජනමාධ්‍ය වාරණයක ට ලක් කිරීම.

(35) සමානත්මතාවය තහවුරු කිරීම හා සම්බන්ධ නොගැළපෙන ප්‍රකාශය වන්නේ,

(1) සියළු දෙනාටම ප්‍රමාණවත් අවස්ථාව සලසා දීම.
(2) නිදහස උපරිමව භුක්ති විඳීමට සැලසීමෙන් සමානාත්මතාවය සුරක්ෂිත වේ.
(3) සුළු පිරිසකට ආර්ථික බලය ඒකරාශී නොකිරීම.
(4) පුරවැසියන් අතර වෙනස්කම් වලට ඉඩ ප්‍රස්ථා නොතැබීම.
(5) පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසීම.

**ප්‍රශ්න අංක. 36 සිට 50 දක්වා ප්‍රශ්නවලදී නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.**

(36) කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් වන්නේ,

(1) ඒකීය පරිපාලන ක්‍රමයක් ඇති කිරීම.
(2) ඒකීය අධිකරණ ක්‍රමයක් ස්ථාපිත කිරීම.
(3) ව්‍යාපාරික වතු වගාව ආරම්භ කිරීම.
(4) පාර්ලිමේන්තු ක්‍රමයක් ස්ථාපිත කිරීම.
(5) පරිපාලන කටයුතුවල නිරතවූ යුරෝපියන් සංඛ්‍යාත්මකව අඩු කිරීම.

(37) ඉංග්‍රිසි අධ්‍යාපනය මෙරට ස්ථාපිත කිරීමෙන් මතුවූ ගැටළුවකි.

(1) ස්වභාෂා පාසල් අනාරක්ෂිත වීම.
(2) බටහිර ගැති මධ්‍යම පන්තියක් නිර්මාණය වීම.
(3) බටහිර දේශපාලන ක්‍රමයන් පිළිබඳ ඉගෙනීමට අවස්ථාව ලැබීම.
(4) දේශීය උද්ඝෝෂණ ව්‍යාපාර ඒකාබද්ධ වීම.
(5) බෞද්ධයින් කතෝලික ආගම වැළඳ ගැනීම.

(38) වතු වගාව නිසා ඇතිවූ යහපත් ප්‍රතිඵලයකි.
(1) නව දුම්රිය මාර්ග හා මහාමාර්ග රැසක් බිහිවීම.
(2) ව්‍යාපාරික ක්ෂේත්‍රයන්ට අදාළ නව ආයතන බිහිවීම.
(3) දේශීය ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටීම.
(4) බැංකු හා රක්ෂණ ක්‍රම ඇතිවීම.
(5) කම්කරු ව්‍යාපාරය ශක්තිමත් වීම.

(39) කෲවේ-මැකලම් යෝජනා ක්‍රමය,
(1) 1910 දී හඳුන්වා දෙන ලදී.
(2) නිල නොලත් සභික සංඛ්‍යාව ප්‍රථම වරට වැඩි විය.
(3) ව්‍යවස්ථාදායකයේ සංයුතිය 21 කි.
(4) ඡන්දයෙන් පත්කර ගැනීමේ මූලධර්මය භාවිතා කිරීම.
(5) ව්‍යවස්ථාදායකයේ සංයුතිය ඉහළ යාම.

(40) 1920 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය,
(1) ලංකා ජාතික සංගමයේ ඉල්ලීමට අනුකූල ප්‍රතිසංස්කරණය කි.
(2) ව්‍යවස්ථාදායකයේ බහුතරය ප්‍රථම වරට වැඩිවිය.
(3) ව්‍යවස්ථාදායකයේ සාමාජික සංඛ්‍යාව 37 තෙක් ඉහළ ගියේය.
(4) විධායක සභාවේ උපදෙස් පිළිගැනීමට ආණ්ඩුකරු බැඳී නොසිටියේ ය.
(5) ව්‍යවස්ථාදායකයාට පත්වන අපේක්ෂක සුදුසුකම් ඉහළ නංවා තිබුණි.

(41) මැනිං-ඩෙවන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින්,
(1) ආණ්ඩුකරු ව්‍යවස්ථාදායකයේ මෙන්ම විධායක සභාවේ දී වැඩි බලතල භුක්ති වින්දේය.
(2) විධායක මණ්ඩලය සාමාජිකයින් සිව්දෙනෙකුගෙන් සමන්විත විය.
(3) බලය හා වගකීම විධායක සභාවට පැවරුනි.
(4) ආණ්ඩුකරු ඉතාමත් අඩුවෙන් ව්‍යවස්ථාදායක සභාවේ රැස්වීම්වලට සහභාගි විය.
(5) මුදල් කටයුතු පරීක්ෂා කිරීමට හා සාකච්ඡා කිරීමට ව්‍යවස්ථාදායක සභාවට බලය තිබුණි.

(42) ජාතික ව්‍යාපාරයක් යනු,
(1) ජාතික රාජ්‍යයන් නිර්මාණය කිරීමට ගෙන යනු ලබන සංවිධානාත්මක ව්‍යාපාරයන් ය.
(2) යටතේ විජිත භාවයෙන් මිදීම සඳහා ස්වදේශිකයන් විසින් ගෙන යනු ලබන සංවිධිත සංවිධානයකි.
(3) ජාතික එක්සත්කම හා ජාතික නිදහස ලබා ගැනීමට සඳහා ඉදිරියට ගෙන ගිය ව්‍යාපාරයන් ය.
(4) ජාතියට අයත් ජන කණ්ඩායම් ජාතික අනුකූලනයක් කටයුතු කරන අවස්ථාවන් ය.
(5) ජාතිවාදී හැඟීමෙන් තම ජාතිය නගා සිටුවීම සඳහා අතර ජාතිකයන්ට එරෙහිව ගෙන යනු ලබන ව්‍යාපාරයන් ය.

(43) ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයේ ලක්ෂණයකි.
(1) පටු අරමුණු ඔස්සේ බෙදී ගිය ව්‍යාපාරයක් වීම.
(2) ස්ථාවර අරමුණක් සහිතව සංවිධානය වීම කටයුතු කිරීම.
(3) යුරෝපීය ධන පංතිය විසින් අත්හරින ලද උද්ඝෝෂණ ව්‍යාපාරයකින් ආරම්භ කිරීම.
(4) අමද්‍යප, ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ, ස්වාධීනත්වය ලබා ගැනීම වැනි කණ්ඩායම් ත්‍රිත්වයක සංකලනයක් වීම.
(5) සමස්ථ ලාංකිකත්වයෙන් මිදුනු සිංහල මධ්‍යම පාන්තික නායකත්වයන්ට සීමාවීම.

(44) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් ගෙන ආ යෝජනාවක් වූයේ,

(1) සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම.
(2) ව්‍යවස්ථාදායක සභාවක් නිර්මාණය කිරීම.
(3) වයස අවුරුදු 21 ට වැඩි සියලුම ලාංකිකයන්ට ඡන්ද බලය හිමි කරදීම.
(4) ආණ්ඩුකරුට සුවිශේෂී බලතල පිරිනැමීම.
(5) විධායක කාරක සභා සභාපතිවරුන්ට අමාත්‍ය මණ්ඩල පිරිනැමීම.

(45) රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දක්නට ලැබුණු යහපත් ප්‍රතිචාරයකි.

(1) අනාගත නායකයින් පුහුණු කිරීම.
(2) දේශපාලන පක්ෂ පිහිටුවා ගැනීම.
(3) වැදගත් මාතෘකා පිළිබඳ දීර්ඝ සංවාදවල යෙදීම.
(4) සුභසාධක රාජ්‍ය ක්‍රමයට රාජ්‍ය පාලනය මාරු වීම.
(5) සුළු ජාතික මන්ත්‍රීවරුන්ට තම අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම.

(46) ඩොනමෝර් ක්‍රමය යටතේ ආණ්ඩුකරුගේ බල නිශේධනයට යටත් වූ පනත් වූයේ,

(1) ජනවාර්ගික භේදයට උපස්ථම්භක වන විෂයයන්
(2) රාජ්‍ය සේවාව හා සම්බන්ධ පනත්
(3) සුළු ජන කොටස් තෘප්තිමත් කරන පනත්
(4) බාහිර වෙළඳාමට බලපාන පනත්
(5) අධිකරණයේ ස්වාධීනත්වයට බලපාන පනත්

(47) ඩොනමෝර් අමාත්‍ය මණ්ඩලය,

(1) සාමාජිකයින් දස දෙනෙකුගෙන් සමන්විත වේ.
(2) රැස්වීමක ඝණ පූර්ණය වන්නේ රාජ්‍ය නිළධාරීන් 3 ක් සහ තවත් අමාත්‍යවරු 2 කි.
(3) මහ ලේකම්වරයා අමාත්‍ය මණ්ඩලයේ සභාපතිවරය යි.
(4) ආරම්භක කාලය තුළ එක්සත් කණ්ඩායමක් ලෙස කටයුතු නොකළේය.
(5) අමාත්‍යවරයෙකු ලෙස පත්වීමට ආණ්ඩුකරුගේ අනුමැතිය අවශ්‍ය වේ.

(48) මුදල් ලේකම්ට අයත් කාර්යයන් වූයේ,

(1) වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරීම.
(2) විදේශ ණය ගනුදෙනු පාලනය
(3) ගබඩා පාලනය
(4) රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ පැවැත්වීම.
(5) රජයේ කොන්ත්‍රාත් දීම.

(49) විධායක කාරක සභාවල අයහපත් අංගයන් වූයේ,

(1) සුළු ජාතික මන්ත්‍රීවරුන්ට පරිපාලන කටයුතු වලට අවස්ථාව නොලැබීම.
(2) කාරක සභා කටයුතු මන්දගාමී වීම.
(3) පාලන කටයුතු සම්බන්ධීකරණයක් නොමැතිවීම.
(4) වගකීමෙන් පලා යාමට හැකි වීම.
(5) ප්‍රමුඛතා පටලවා ගැනීම.

(50) සෝල්බරි ආණ්ඩුක්‍රම ලක්ෂණයන් වූයේ,

(1) ද්වි මණ්ඩලික ව්‍යවස්ථාදායකය
(2) නාමික විධායකය
(3) ජනාධිපති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය
(4) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
(5) ස්වාධීන අධිකරණ ක්‍රමයක් ස්ථාපිත කිරීම.

***

ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.
D.S. Senanayake College, Colombo 07.

තුන්වන වාර ඇගයීම -2016
Third Term Test - 2016
12 ශ්‍රේණිය -
Grade 12

# දේශපාලන විද්‍යාව - II
# Political Science - II

පැය තුනයි.
Three hours

- මෙම ප්‍රශ්න පත්‍රයව කොටස් 2 කින් යුක්ත වේ.
- "A" කොටසේ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු එහිම ලියන්න. "B" කොටසින් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු ලියන්න.

## "A" කොටස

(01) දේශපාලන විද්‍යාව ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න.

(1) ........................................

(2) ........................................

(02) දේශපාලන විද්‍යාව විෂය ක්ෂේත්‍රයට අළුතින් එක්වූ ඒකකයන් දෙකක් ලියන්න.

(1) ........................................

(2) ........................................

(03) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය කරන ආකාර දෙකක් නම් කරන්න.

(1) ........................................

(2) ........................................

(04) දාර්ශනික අධ්‍යයන ක්‍රමයේ ඌනතා දෙකක් දක්වන්න.

(1) ........................................

(2) ........................................

(05) ආණ්ඩුවේ බලය සංවරණය කිරීමට යොදාගත හැකි ක්‍රම දෙකක් දක්වන්න.

(1) ........................................

(2) ........................................

(06) ස්වාධිපත්‍ය න්‍යායේ සහ බලතල බෙදීමේ න්‍යායේ නිර්මාතෘවරුන් දෙදෙනා නම් කරන්න.

(1) ........................................

(2) ........................................

(07) ගුණාත්මක සාධක පදනම් කොට ගෙන දේශපාලන පක්ෂ කොටස් දෙකකට බෙදනු ලැබේ. එම කොටස් දෙක නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(08) සන්ධිය ආණ්ඩුක්‍රමයකින් ඒකිය ආණ්ඩුක්‍රමයක් වෙනස් වන්නේ ප්‍රධාන වශයෙන් කරුණු දෙකක් හේතු කොට ගෙනය. එනම්,

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(09) බලපෑමේ කණ්ඩායම් වල ලක්ෂණයන් වන්නේ,

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(10) බලතල බෙදීමේ න්‍යායේ යහපත් ලක්ෂණ දෙකක් දක්වන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(11) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් ඉටුවිය යුතු කාර්යයන් වන්නේ,

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(12) 1833-1924 තෙක් ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යටතේ ව්‍යවස්ථාදායක සභාවේ සිටි මන්ත්‍රීන් දෙවර්ගයකි. ඒවා නම්,

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(13) ලංකාවේ ජාතික ව්‍යාපාරයේ කලින් කල පෙරමුණ ගත් කණ්ඩායම් කිහිපයකි. ඒවා විවිධ මුහුණුවරින් ඉදිරිපත් විය. එම ව්‍යාපාරයන් නම් කරන්න.

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(14) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ විසින් මෙරට ආර්ථික පද්ධතියට බලපෑම් කළ යෝජනා දෙකක් ලියන්න.

(1) ..........

(2) ..........

(15) කැමරන් විසින් හඳුන්වා දෙන ලද අධිකරණ ප්‍රතිසංස්කරණ දෙකක් නම් කරන්න.

(1) ..........

(2) ..........

(16) ඩෙවන්ෂයර් ප්‍රතිසංස්කරණය මගින් ව්‍යවස්ථාදායක පත්කළ ගණන කියද?

(1) නිළලත් මන්ත්‍රීන් - ..........

(2) නිළනොලත් මන්ත්‍රීන් - ..........

(17) ඩොනමෝර් යෝජනාවන්ට පසුබිම් වූ හේතු දෙකක් ලියන්න.

(1) ..........

(2) ..........

(18) සර්වජන ජන්ද බලය ප්‍රදානය කිරීම නිසා සිදුවූ ප්‍රගතිශීලී ප්‍රතිවිපාක දෙකක් ලියන්න.

(1) ..........

(2) ..........

(19) රාජ්‍ය නිළධාරීන් හැඳින්වූයේ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ මුර බල්ලන් ලෙස යි. ඔවුන්ට හිමි වූ තනතුරු නම් කරන්න.

(1) ..........

(2) ..........

(20) රාජ්‍ය මන්ත්‍රණ සභාවෙන් ප්‍රථම පාර්ලිමේන්තුවට පත්ව ආ සුවිශේෂ පුද්ගලයින් කිහිපදෙනෙකි. ඔවුන්ගෙන් දෙදෙනෙකු නම් කරන්න.

(1) ..........

(2) ..........

## B - කොටස

### I - කොටස

(01) දේශපාලන විද්‍යාව විෂයේ ප්‍රධාන තේමාව වන්නේ රාජ්‍යය යි. ඔබේ අදහස් දක්වන්න.

(02) (1) නීතියේ මූලාශ්‍ර පැහැදිලි කරන්න.

(2) මිනිසුන් නීතියට අවනත වීමට පදනම් වන සාධක සාකච්ඡා කරන්න.

(03) නියෝජන සිද්ධාන්ත හඳුන්වා සමානුපාතික යෝජනා ක්‍රමයේ වාසිදායක තත්ත්වයන් පැහැදිලි කරන්න.

(04) පහත දැක්වෙන ඒවායින් ඕනෑම කරුණු දෙකක් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

(1) දේශපාලන පක්ෂවල කාර්ය භාරය

(2) ව්‍යවස්ථානුකූල වාදය

(3) සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම

(4) සන්ධීය ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ

(5) අධිකරණයේ ස්වාධීනත්වය

### II - කොටස

(05) කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් සිදුවූ සමාජ ආර්ථික දේශපාලන ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

(06) ලංකාවේ ජාතික ව්‍යාපාරයේ විවිධ අවධීන් පහත සඳහන් ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න.

(1) ආගමික පුනරුද ව්‍යාපාරයක් ලෙස

(2) අමද්‍ය ව්‍යාපාරය ලෙස

(07) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ,

(1) සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම.

(2) ආණ්ඩුකාරවරයාගේ කාර්ය භාරය පැහැදිලි කරන්න.

(08) පහත සඳහන් ඒවායින් දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

(1) මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

(2) රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.

(3) රාජ්‍ය නිලධාරීන් සඳහා

(4) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

***